# සිංහල

## අපේ සාම්ප්‍රදායික යෙදුම්


Copyright © e-thaksalawa.moe.gov.lk

# අපේ සාම්ප්‍රදායික යෙදුම්

බස රසවත් කිරීමටත් ප්‍රාණවත් කිරීමටත් සිංහලයේ විවිධාකාර වූ යෙදුම් භාවිතයට ගනී.ඒ නිසා ම කියවීමේ රුචිය ද ඇති වේ.එවැනි යෙදුම් පහත සඳහන් පරිදි වර්ග කළ හැකිය.

1. යුගල පද
2. ඉඟිවැකි (රුඪි)
3. ආප්තෝපදේශ
4. ප්‍රස්ථාව පිරුළු

# යුගල පද

- අර්ථය වැඩි කිරීමට හා රසවත් කිරීමට තනි පදයක් වෙනුවට පද දෙකක් (යුගල පදයක්) යොදා ගැනීම සිදු කෙරේ.

- උදා:- පියාගේ <u>අත මිට</u> සරු වූ නිසා නව නිවසේ වැඩ කටයුතු ඉක්මණින් නිම විය.

- එවැනි යුගල පද පහත සඳහන් පරිදි වර්ග කළ හැකිය.

# යුගල පද

| සමානාර්ථය හඟවන යුගල පද | සමීපාර්ථය හඟවන යුගල පද | විරුද්ධාර්ථය හඟවන යුගල පද | එක් පදයක පමණක් අර්ථය ඇති යුගල පද | පද දෙකෙහි ම අර්ථය නැති යුගල පද | කෘදන්ත පද ඇසුරින් තැනුණු යුගල පද |
|---|---|---|---|---|---|
| වැර වෑයම් | කොට්ට මෙට්ට | අය වැය | මුදල් හදල් | අනම් මනම් | ඉවුම් පිහුම් |
| සැප සනීප | හැළි වළං | ගොඩ මඩ | ගණන් හිලව් | වං හුං | කියුම් කෙරුම් |
| සරු සාර | නීති රීති | අග මුල | ළමයි බමයි | ඕප දූප | ඉඳුම් හිටුම් |
| අවි ආයුධ | ඇට කටු | සිරිත් විරිත් | හිතා මතා | ලට්ට ලොට්ට | රැවුම් ගෙරවුම් |
| ශුද්ධ පවිත්‍ර | වත් පිළිවෙත් | හරි වැරදි | සද්ධ බද්ධ | හෝන්දු මාන්දු | නැටුම් ගැයුම් |
| ආධාර උපකාර | ළමා ළපටි | එදා මෙදා | ඉඩම් කඩම් | කුඩු කේඩු | ඇනුම් බැණුම් |
| දුක් දොම්නස් | සතා සීපාවා | අතන මෙතන | | | |

# ඉඟිවැකි (රූඪී)

- පවසන අදහස වෙනත් ආකාරයකින් ඉදිරිපත් කිරීම මින් අදහස් වේ. ගැමියන්ගේ කථින ව්‍යවහාරයේ දී ඉඟි වැකි බහුල ලෙස ම භාවිත වේ.

- උදා:- ඉහේ මලක් පිපුණා යන ඉඟි වැකියෙන් අධික සතුටට පත් වුණා යන අර්ථය හැඟවෙයි.

- “තම පතා විභාගය ඉහළින් සමත් වූ බව ඇසූ අම්මාගේ ඉහේ මලක් පිපුණි.”

- එවැනි ඉඟිවැකි කිහිපයක් පහත දැක්වේ.

# ඉඟිවැකි (රූඪී)

| | |
|---|---|
| •අල්ලපනල්ලේ - අතරවාරයේ<br><br>•සායම ගියා - ගෞරවය නැති වුණා<br><br>•ගොළුබෙලි ගමනකින් - ඉතා සෙමෙන් ගමන<br><br>•ලැල්ලට පාගල ගියා - අධික වේගයෙන් ගියා<br><br>•ඉන්තේරුවෙන් ම - ස්ථිර ලෙසම<br><br>•අන්දුන්කුන්දුන් වී - බියට පත් වුනා | •හරි හතරැස් විදියට - අංග සම්පූර්ණ ලෙස<br><br>•හාංකවිසියක් දැන සිටියෙ නෑ - කිසි තොරතුරක් දැන සිටියෙ නෑ<br><br>•අතමාරුවක් ඉල්ලා ගන්න - ණයට මුදලක් ඉල්ලා ගන්න<br><br>•සොච්චමක් - ඉතා ස්වල්පයක් |

# ආප්තෝපදේශ

- පුරාණ කාලයේ ජීවත් වූ උගත් වැඩිහිටියන් ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් පාදක කර ගෙන සමාජයට දෙනු ලැබූ අවවාද අනුශාසනා, උපදේශ මුල් කර ගෙන ආත්තෝපදේශ ගොඩ නැගී ඇත.

- උදා:-
    - පනින්ට පෙර සිතා බලනු.
    - පෙරළෙන ගලේ පාසි නොබැඳේ.
    - කඩුවට වඩා පෑන බලවත්ය.
    - දිලිසෙන සියල්ල රත්රන් නොවේ.
    - පැමිණි දුක් පැණි රසයි.
    - හිත ඇත්නම් පත කුඩාද?

# ප්‍රස්ථාව පිරුළු

- ඈත අතීතයේ සිට ම යම් සිද්ධියක් හෝ අවස්ථාවක් අරබයා ගොඩ නැගී ඇති කියමන් ප්‍රස්ථාව පිරුළු වශයෙන් ගැනේ.
- මේවා භාෂිත මෙන්ම ලෙඛන ව්‍යවහාරයේදීත් යොදා ගැනෙන්නේ පවසන අදහස රසවත් හා අර්ථවත් කිරීමටය.
- එම ප්‍රස්ථාව පිරුළු ද පහත සඳහන් පරිදි වර්ග කළ හැකි ය.
  - ඥාතීත්වය හැඟවෙන ප්‍රස්ථාව පිරුළු
  - එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රස්ථාව පිරුළු
  - ආහාර පාන හා සම්බන්ධ ප්‍රස්ථාව පිරුළු
  - උපහාසය ජනනය කරන ප්‍රස්ථාව පිරුළු
  - උපදේශාත්මක ප්‍රස්ථාව පිරුළු
  - රාජ්‍යත්වය හා සම්බන්ධ කථා ඇසුරෙන් තැනුණු ප්‍රස්ථාව පිරුළු
  - ජන කථා සම්බන්ධ ප්‍රස්ථාව පිරුළු
  - අනුප්‍රාස රසය දැනෙන ප්‍රස්ථාව පිරුළු

# ප්‍රස්ථාව පිරුළු

- **ඥාතීත්වය හැඟවෙන ප්‍රස්ථාව පිරුළු**
  - හොරාගේ අම්මගෙන් පේන අහනව වගේ - තොරතුරු වසන් කරන අයෙකුගෙන් එම තොරතුරු විමසීම.
  - උණහපුලුවාට උගේ දරුවා මැණිකක් ලු - තමාගේ දෙය කොතරම් නොවටිනා වුවත් තමාට වටිනා බව.
  - එපා වාහෙට හොදි බෙදන්නා වගේ - අකමැත්ත ප්‍රකාශ කිරීම.
  - නැන්දම්මාගෙ  ආදරේ වගේ - දිනෙන් දින හීන වන ආදරය.

# ප්‍රස්ථාව පිරුළු

- එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රස්ථාව පිරුළු
  - අපි කන හැටි ලිපා දනී - අග හිඟකම් වැඩි බව.
  - අටුව කඩා පුටුව හැදුව වගේ - වැඩි අගය ඇති දෙය විනාශ කර අඩු අගයක් ඇති දෙයට තැන දීම.
  - අනුන්ගෙ පානින් එළිය බලන්නා වගේ - අනුන්ගෙන් යැපීමට කටයුතු කිරීම.

# ප්‍රස්ථාව පිරුළු

- ආහාර පාන හා සම්බන්ධ ප්‍රස්ථාව පිරුළු
  - කොහොඹ ගහට කරිවිල වැල ගියා වගේ - දුදනන් දෙදෙනෙකු එකතු වුනා .
  - පැණි වරකා ගහට හෙණ ගැහුව වගේ - උතුම් අයටත් කරදර පැමිණෙයි.
  - කිරි කළයට ගොම බින්දුවක් වැටුණ වගේ - ලොකු යහපතක් සුලු වරදකින් නැති වී යාම.
  - අතු කඩා මොර කන්නා සේ - ආදායම් මාර්ග සම්පූර්ණයෙන් ම වසා ගැනීම.
  - අතිරසත් තිත්ත වෙනවාලු - ප්‍රමාණය ඉක්මවීමෙන් දුර්විපාක ලැබේ.

# ප්‍රස්ථාව පිරුළු

- උපහාසය ජනනය කරන ප්‍රස්ථාව පිරුළු
  - නාකි විසේ ගෙටත් උසේ  කිච්වලු - වයසට නොගැළපෙන දේ කිරීම.
  - ඇටි කෙහෙල් කාපු උගුඩුව වගේ - වැරදි කරමින් කළ වැරදි ගැන පසු තැවීම.
  - උපාසක බළල්ලු මීයන් දෙන්න දෙන්න අල්ලනව වගේ - යහපත් අය මෙන් පෙනී සිට වැරදි වැඩවල යෙදීම.

# ප්‍රස්ථාව පිරුළු

- උපදේශාත්මක ප්‍රස්ථාව පිරුළු

  - දුවන මුවන් දැක නොදමන් නෙළු පලා - වටින දේ ලබා ගැනීමට අත ඇති දේ අත්හල යුතු නැත.

  - ඇවිද්ද පය දහස් වටී - දේශාටනය ඉතා වැදගත්ය.

  - ගිය නුවණ ඇතුන් ලවාවත් ඇද්දවිය නොහැක - කළ මෝඩකම්වලට පිළියම් නැත.

# ප්‍රස්ථාව පිරුළු

- රාජ්‍යත්වය හා සම්බන්ධ කථා ඇසුරෙන් තැනුණු ප්‍රස්ථාව පිරුළු

  - ඉඟුරු දීල මිරිස් ගත්ත වගේ - යම් අපහසුවකින් මිදීමට තවත් අපහසු දෙයක් ළං කර ගත යුතු නැත.

  - පරංගියා කෝට්ටේ ගියා වගේ - පහසුවෙන් කළ හැකි දේ අපහසුවෙන් කළ යුතු නැත.

  - කැකිල්ලෙ රජ්ජුරුවන්ගෙ නඩු තීන්දුව වගේ - සාධාරණ විනිශ්චයක් නැත.

# ප්‍රස්ථාව පිරුළු

- ජන කථා සම්බන්ධ ප්‍රස්ථාව පිරුළු
  - අබරා සිල් ගත්ත වගේ - නුපුරුදු දේ කරන්නට ගොස් කරදරයේ වැටීම.
  - පුහුල් හොරා කරෙන් දැනේ - වැරදිකරුවා ස්වරූපයෙන්, හැසිරීමෙන් හඳුනාගත හැකිය.
  - ගම්පොළයයි රයිගමයයි වගේ - කපටියන් දෙදෙනෙකු එකතු වීම.

# ප්‍රස්ථාව පිරුළු

- අනුප්‍රාස රසය දැනෙන ප්‍රස්ථාව පිරුළු
  - බල්ලන්ට ලෙලි පොල් දුන්න වගේ - නිෂ්ඵල යමක් කිරීම
  - අලි බලලයි බලි බලලයි ඇති වෙන්නෙ නැහැ - ක්‍රියාකාරිත්වය වැඩි තරමට එහි දැක්මේ රුචියද වැඩියි.
  - උඩින් හකුරු යටින් කතුරු - මිතුරු කමින් සිට සතුරුකම් කිරීම.